සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
**Year End Evaluation - 2024 (2025)**

| ශ්‍රේණිය / தரம் / Grade | 09 | විෂයය / பாடம் / Subject | නර්තනය (දේශීය) | පත්‍රය / வினாத்தாள் / Paper | I,II | කාලය / காலம் / Time | පැය 2 යි |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................

**සැලකිය යුතුයි**

**පළමු කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න .**

- **11,111,1V කොටස්වලින් ඔබ ඉගෙන ගන්නා ප්‍රධාන නර්තන සම්ප්‍රදායට අයත් කොටසට පිළිතුරු සපයන්න.**

**1 කොටස**

1) " එපා කියන තැන තැන නොසිටිල්ලා........."කවිය භාවිත කරමින් ඉදිරිපත් කරන ගැමි නැටුම වනුයේ,

1) ලී කෙළි ය. 2) කුලු ය. 3) ගොයම් ය. 4) තාලම් ය.

2) බීජාක්ෂර වාදනයේ දී "තත්" හා "නං" යන අක්ෂර උත්පාදනය කරනු ලබන්නේ,

1) බෙරයේ වම් පසින් හා දකුණු පසිනි. 2) බෙරයේ දකුණු පසින් හා වම් පසිනි.
3) බෙරයේ වම් පසින් පමණි. 4) බෙරයේ දකුණු පසින් පමණි.

3) " රන් වන් දුල් කරලින් පැසිලා..................." ගීතය රචනා කරන ලද්දේ,

1) මර්සලින් ජයකොඩි පියතුමා විසිනි. 2) ආනන්ද සමරකෝන් විසිනි.
3) මහගම සේකර මහතා විසිනි. 4) බෙනඩික් ප්‍රනාන්දු විසිනි.

4) ශෛලීගත නාට්‍යයක් වනුයේ .................... ය.

1) කැලෑ මල් 2) මෝදර මෝල 3) කැලණි පාලම 4) නරි බෑනා

5) දේවදාසීන් සිටි බවත්, නළලෙහි සලකුණු තබා ඔවුන් හත් දෙනෙකු පිදූ බවත් සඳහන් වන්නේ,

1) සැස්සේරුව සෙල්ලිපියේ ය. 2) පාලමොට්ටායි සෙල්ලිපියේ ය.
3) කොරවක්ගල ලෙන්ලිපියේ ය. 4) ගල් ආසන ලිපියේ ය.

6) දාසිආට්ටම් නමින් හැඳින්වූ නර්තන සම්ප්‍රදායට භරත නාට්‍යම් නමින් වඩාත් අගයක් එක් කිරීමට සමත් වූයේ කවුද?

1) මීනාක්ෂි සුන්දරම් පිල්ලෙයි 2) බාල සරස්වතී
3) ශ්‍රීමතී ශාන්තා 4) අමිලා දේවි

7)

   

පංච තූර්ය භාණ්ඩ වර්ගීකරණයට අනුව ඉහත වාද්‍ය භාණ්ඩ අයත් අනුපිළිවෙල වනුයේ,

1) ආතත, විතත, විතතාතත, හා සුෂිර ය. 2) ආතත.විතතාතත, ඝන හා විතත ය.

3) ආතත, ඝන, විතත, හා සුෂිර ය. 4) ආතත, ඝන, විතතාතත, හා විතත ය.

8)

| A | B | C | D |
|---|---|---|---|
| ශබ්දම් | පදම් | ආමද් | ගත් |
| සලාම් | තිල්ලානා | පරන් | වර්ණම් |

ඉහත වගුවෙහි ඇතුළත් නර්තනාංග අතුරින් කථක් නර්තන සම්ප්‍රදායට අයත් නර්තනාංග දෙකක් දැක්වෙනුයේ,

1) A තීරුවේ ය. 2) B තීරුවේ ය. 3) C තීරුවේ ය. 4) D තීරුවේ ය.

9) නර්තන කලා ඉතිහාසය පිළිබඳ හැදෑරීමේදී උපකාරීවන ගල් කැටයම් දක්නට ලැබෙන ස්ථානයක් නොවන්නේ,

1) ලෝවාමහාපාය යි. 2) ගඩලාදෙණිය විහාරය යි.

3) යාපහුව දළදා මාළිගාව යි. 4) ඇම්බැක්කේ දේවාලය යි.

10) දළදා පෙරහැරට සහභාගී වූ සියලු දෙනාගේ වස් දොස් දුරු කිරීම සඳහා..............ශාන්තිකර්මය පවත්වනු ලබයි.

1) ගම්මඩු 2) වලියක් මංගල්ලය 3) කොහොඹා කංකාරිය 4) පූනා මඩුව

11) ප්‍රස්තාර කිරීමේදී " ∧ , / " යන තාල සලකුණු ද්විත්වය අනුපිළිවෙලින් යෙදෙන බෙර පදය වනුයේ,

1) දොං ජිංත ගත දොංත ය. 2) දොදොංත තකු දොං ය.

3) කුඳ ගත ගත දොම් ය. 4) ජිං ගත ගොගො

12) ශෝකය නමැති ස්ථායී භාවයෙන් උපදින රසය කුමක් ද?

1) ශාන්ත රසය. 2) වීර රසය. 3) කරුණා රසය. 4) භයානක රසය.

13) වාද්‍ය භාණ්ඩ පිළිබඳ තොරතුරු ඇතුළත් තිසර සංදේශය ලියවී ඇති යුගය වන්නේ,

1) කෝට්ටේ ය. 2) අනුරාධපුරය ය. 3) පොළොන්නරුව ය. 4) ගම්පොළ ය.

14) "ගුහ අපලය" මුද්‍රා නාට්‍ය නිර්මාණය කරන ලද්දේ,

1) ප්‍රේමකුමාර එපිටවෙල මහතා ය. 2) එස්. පණිභාරත මහතා ය.

3) ජේ. ඊ.සේදරමන් මහතා ය. 4) තිත්තවෙල ගුණයා මහතා ය.

15) මුරුගන් දෙවියන්ට පූජා පණිස පවත්වනු ලබන ද්‍රවිඩ ගැමි නැටුමක් වන්නේ,

1) කාවඩි 2) කරගම් 3) සෙම්බු 4) කෝලාට්ටම්

## 11 කොටස - උඩරට නර්තනය

16) ගොඩ සරඹ නටා අවසන් කරනුයේ,

1) ඉරට්ටියෙනි.
2) හමාර පදයෙනි.
3) කලාසමෙනි.
4) කස්තිරමෙනි.

17) ගැට බෙරයෙ හි කඳේ දිග ප්‍රමාණය වනුයේ,

1) එක් වියත් තුනගුලයි.
2) තුන් වියත් තුනගුලයි.
3) පසළොස් අඟුලයි.
4) එක් වියත් දෑඟුලයි.

18) සිංහරාජ වන්නමේ තාල රූපය කුමක් ද?

1) මාත්‍රා 2 තනි තිත ය.
2) මාත්‍රා 3 තනි තිත ය.
3) මාත්‍රා 4 තනි තිත ය.
4) මාත්‍රා 2+3 දෙතිත ය.

19) කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ පුරාවෘත්තය හා බැඳුණු චරිත වන්නේ,

1) මලය රජු හා කුවේණි ය.
2) සේරමන් රජු හා මලය රජු ය.
3) සේරමන් රජු හා විජය රජු ය.
4) කුවේණි හා පත්තිනි දේවිය ය.

20) උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රවීණ ශිල්පියෙකි.

1) විල්සන් ඔලබොඩුව මහතා
2) එන්.ජී. සිරිබෝහාමි මහතා
3) කේ. එස්. ප්‍රනාන්දු මහතා
4) අරනෝලිස් ඉඹුල්ගොඩ මහතා

## 111 කොටස - පහතරට නර්තනය

16) ඉලංගම් සරඹ නටා අවසන් කරනුයේ,

1) කස්තිරමෙනි.
2) හමාර පදයෙනි.
3) කලාසමෙනි.
4) ඉරට්ටියෙනි.

17) පහතරට බෙරයෙහි කඳෙහි දිග ප්‍රමාණය වනුයේ

1) එක් වියත් තුනගුලයි.
2) තුන් වියත් තුනගුලයි.
3) පසළොස් අඟුලයි.
4) එක් වියත් තුනගුලයි.

18) අනුරාගදණ්ඩ තාලය සින්දු වන්නමේ තාලරූපය කුමක් ද?

1) මාත්‍රා 2 තනි තිත ය.
2) මාත්‍රා 3 තනි තිත ය.
3) මාත්‍රා 4 තනි තිත ය.
4) මාත්‍රා 2+3 දෙතිත ය

19) දෙවොල් මඩු ශාන්තිකර්මයේ පුරාවෘත්තය හා බැඳුණු චරිත වන්නේ,

1) සේරමන් රජු හා පත්තිනි දේවිය ය. 2) විජය රජු හා පත්තිනි දේවිය ය.

3) මලය රජු හා පඬුවස්දෙව් රජු ය. 4) කුවේණිය හා සේරමන් රජු ය.

20) පහතරට නර්තන සම්ප්‍රදායේ ප්‍රවීණ ශිල්පියෙකි.

1) එස්.පණිභාරත මහතා 2) අරනෝලිස් ඉඹුල්ගොඩ මහතා.

3) නිත්තවෙල ගුණයා මහතා. 4) විල්සන් ඔලබොඩුව මහතා.

## 1V කොටස - සබරගමු නර්තනය

16) දොඹින පද නටා අවසානයේ නර්තනය කරනු ලබන්නේ

1) කස්තිරමයි 2) ඉරට්ටියයි

3) කලාසමයි 4) හමාර පදයයි

17) දවුල් උපතේ සඳහන් ආකාරයට කඳේ දිග ප්‍රමාණය

1) තුන් වියත් තුනඟුලයි. 2) පසළොස් අඟුලයි.

3) එක් වියත් තුනඟුලයි. 4) එක් වියත් දෑඟුලයි.

18) විරාඩි වන්නමේ තාල රූපය කුමක් ද?

1) මාත්‍රා 2 තනි තිත ය. 2) මාත්‍රා 3 තනි තිත ය.

3) මාත්‍රා 4 තනි තිත ය. 4) මාත්‍රා 2+3 දෙතිත ය

19) පහන්මඩු ශාන්තිකර්මයේ පුරාවෘත්තය හා බැඳුණු චරිත වන්නේ

1) සේරමන් රජු හා පත්තිනි දේවිය ය. 2) විජය රජු හා පත්තිනි දේවිය ය.

3) මලය රජු හා පඬුවස්දෙව් රජු ය. 4) කුවේණිය හා සේරමන් රජු ය

20) සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රවීණ ශිල්පියෙකි.

1) එස්.පණිභාරත මහතා 2) අරනෝලිස් ඉඹුල්ගොඩ මහතා.

3) විල්සන් ඔලබොඩුව මහතා. 4) ජී. වී. හීන්නිළමේ ගුරුතුමා

2025 - 01
ශ - 9
Learning Resource Center
R
5700
De Mazenod College
Kandana

## 11 පත්‍රය

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.

(1) ඔබ විසින් රංග උපකරණයක් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1) ඔබ නිර්මාණය කළ රංග උපකරණය නම් කරන්න. (ල.02)

2) එම රංග උපකරණය නිර්මාණය කිරීමට යොදා ගන්නා අමුද්‍රව්‍ය තුනක් නම් කරන්න. (ල.03)

3) ඔබ නම් කළ රංග භාණ්ඩය නිර්මාණය කළ ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ල.03)

4) එම රංග උපකරණයෙහි රූපසටහනක් අඳින්න. (ල.02)

2)

1) සිංහරාජ වන්නම / අනුරාගදණ්ඩ තාලය/ විරාඩි වන්නමේ බෙර පදය / දවුල් පදය නියමිත තාලරූපයට ප්‍රස්තාර කරන්න. (ල.02)

2) "සොකරී එන්නී සබයෙන් අවසර ගන්නී
නැටුම් නටන්නී තාලෙට රාග කියන්නී"....................යන කවි පද මාත්‍රා 3 තනි තිතට ප්‍රස්තාර කරන්න. (ල.04)

3) වෛරෝඩි වන්නමේ අඩව්ව හෝ ඊශ්වරකුණ්ඩ තාලයේ ඉරට්ටිය හෝ කදම්බ පක්ෂි වන්නමේ අඩව්ව ප්‍රස්තාර කරන්න. (ල.04)

3)

1) නර්තන කලා ඉතිහාසය හැදෑරීමට උපකාරීවන මූලාශ්‍ර දෙකක් නම් කරන්න. (ල.02)

2) අනුරාධපුර යුගයේ නර්තන පරම්පරාවක් සිටි බව දැක්වෙන ලෙන් ලිපිය නම්කර එහි ඇතුළත් සාධකය ලියා දක්වන්න. (ල.04)

3) කෝට්ටේ යුගයේ නර්තන කලාව පැවති බව සන්දේශ කාව්‍යක සාධකයක් ඇසුරෙන් විස්තර කරන්න. (ල.04)

4)

1) පහන්මඩුවේ දී පුද ලබන දෙවිවරු දෙදෙනෙක් නම් කරන්න. (ල.02)

2) දෙවොල් මඩු ශාන්තිකර්මය වර්තමානයේ පැවැත්වීමට හේතු දෙකක් ලියන්න. (ල.04)

3) කොහොඹා කංකාරිය පුරාවෘත්ත කතාව මගින් සමාජයට ලබාදෙන ආදර්ශය පිළිබඳ විමසීමක් කරන්න. (ල.04)

5)

1) සමානකම් දක්නට ලැබෙන සිංහල හා ද්‍රවිඩ ගැමි නැටුම් දෙක බැගින් ලියන්න. (ල.02)

2) ගැමි නැටුම්වල ලක්ෂණ හතරක් ලියන්න. (ල.04)

3) ජීවන වෘත්තීන් හා බැඳි ගැමි නැටුමක් නම් කර, ඊට අදාළ කවියක් ලියන්න. (ල.04)